“කවරෙකු අල්ලාහ් හා අවසන් දිනය විශ්වාස කරන්නෙකු ලෙස සිටින්නේ ද ඔහු තම ආගන්තුකයාට අනුමත කාලයක් ඔහුට සත්කාර කළ යුතුයි. අල්ලාහ්ගේ දූතයාණනි අනුමත කාලය යනු කුමක්දැ?යි ඔවුහු විමසුවෝය. එවිට එතුමා එහි දිනයක් හා රාත්රියක් වේ. ආගන්තුක භාවය දින තුනකි. ඉන් පසුවටත් වී නම් එය ඔහුට සදකාවක් වන්නේය.“ යැයි පැවසූහ.

නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පැවසූ බවට අබූ ෂුරෙය්හ් කුවෙයිලිද් ඉබ්නු අම්ර් අල් කුසාඊ විසින් වාර්තා කරන ලදී. “කවරෙකු අල්ලාහ් හා අවසන් දිනය විශ්වාස කරන්නෙකු ලෙස සිටින්නේ ද ඔහු තම ආගන්තුකයාට අනුමත කාලයක් ඔහුට සත්කාර කළ යුතුයි. අල්ලාහ්ගේ දූතයාණනි අනුමත කාලය යනු කුමක්දැ?යි ඔවුහු විමසුවෝය. එවිට එතුමා එහි දිනයක් හා රාත්රියක් වේ. ආගන්තුක භාවය දින තුනකි. ඉන් පසුවටත් වී නම් එය ඔහුට
සදකාවක් වන්නේය.“ යැයි පැවසූහ. තවත් වාර්තාවක “තම සහෝදරයා අබියස ඔහු පාපයට පත්
කරන තරමට රැඳී සිටීම මුස්ලිම්වරයකුට අනුමත නොවන්නේය. එවිට ඔවුහු අල්ලාහ්ගේ දූතයාණනි, ඔහු පාපයට පත් කරනුයේ කෙසේද? එවිට එතුමා: “ඔහු අබියස ඔහු රැඳී සිටියි.
නමුත් ඔහුට සත්කාර කිරීමට කිසිවක් ඔහු සතුව නැත.“ යැයි පැවසූහ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [මෙහි වාර්තා සම්බන්ධතා දෙකක් සමඟ බුහාරි හා මුස්ලිම් හි එය වාර්තා වී ඇත]

අබූ ෂුරෙය්හ් අල් කුසාඊ -රළියල්ලාහු අන්හු- තුමාගේ හදීසය ආගන්තුකයාට සත්කාර කිරීම සම්බන්ධයෙන් පෙන්වා දෙන්නකි. සැබැවින්ම නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පැවසූ බවට එහි මෙසේ සඳහන්ව ඇත. “කවරෙකු අල්ලාහ් හා අවසන් දිනය විශ්වාස කරන්නෙකු ලෙස සිටින්නේ ද ඔහු තම ආගන්තුකයාට සත්කාර කළ යුතුයි.“ මෙය ආගන්තුකාට සත්කාර කිරීම සඳහා උනන්දු කරවන පාඩමකි. ආගන්තුකයාට සත්කාර කිරීම අල්ලාහ් හා අවසන් දිනය විශ්වාස කර ඇති බවට වූ සළකුණකි එමෙන්ම අල්ලාහ් හා අවසන් දිනය විශ්වාස කිරීමේ පූර්ණභාවය පෙන්වා දෙන්නකි. ආගන්තුකයාට සත්කාර කිරීම යනු, සතුටු මුසු මුහුණෙන් පිළිගැනීම, යහපත් කතාව ඔහු පැමිණි මුල් දිනයේද ඔහු සමුගන්නා දිනයේද ඔහු නවාතැන් ගන්නා දිනයේද කිසිදු අපහසුතාවකින් තොරව දින තුනක් ආහාර සැපයීම වේ. එය ඔහුටත් තමන්ටත් බරක් නොවිය යුතුය. දින තුනකින් පසුව එසේ ඔහු සිදු කරන්නට අපේක්ෂා කරන්නේ නම් එය සදකාවක් ලෙස සළකනු ලැබේ. “ආගන්තුකයාට සත්කාර කළ යුතුයි. එහි අනුමත කාලය දිනයක් හා රාත්රියක් වේ. ආගන්තුක භාවය දින තුනකි“ යන ප්රකාශය වනාහි, විද්වතුන් එය අනුමත කාලය යැයි අදහස් දරති.එනම් එදින හා එදින රාත්රියේ ආගන්තුකයින්ට වැදගත්කමක් දැක්වීම යහපත සැලසීමට හා උපස්ථානය කිරීමට යොමු වීමයි. දෙවන දිනයේ හා තුන්වන දිනයේ තමන්ට පහසු අයුරින් ඔහුට ආහාර සැපයීමයි. සිරිතට අනුව මිස අධික නොකළ යුතුයි. දින තුනකින් පසුව සිදු කරන දෑ සදකාවක් හා යහපත් කටයුත්තක් වේ. ඔහු කැමති නම් සිදු කළ හැක. ඔහු අකමැති නම් අතහැර දැමිය හැක. මුස්ලිම්හි සඳහන් වාර්තාවේ සඳහන් වනුයේ ඔහු පාපයට පත් කරනවන තරමට ඔහු ළඟ ආගන්තුකයකු නොසිටිය යුතු බවය. එහි අර්ථය වනාහි, දින තුනකින් පසුව ඔහු පාපයට ඇද දමන තරමට ආගන්තුකයකු රැදී සිටීම අනුමත නොවන බවය. හේතුව දිගු කලත් ගත වීමෙන් ඔහුට අඩුපාඩු සිදුවනු ඇත එසේ නැතිනම් ඔහුට පීඩාකාරී තත්ත්වයක් උදාවනු ඇත. එසේත් නැතිනම් සුදුසු නොවන දෑ සිතුවිල් හට ගැනෙනු ඇත. මේ සියල්ල සිදුවනුයේ දින

තුනක් ගතවූවායින් පසුව ආගන්තුකයා සමු නොගෙන එහි රැඳී සිටින බැවිනි. ආගන්තුකයාට සත්කාර කිරීම ආගන්තුකයන්ගේ තත්ත්වයන්ට අනුව වෙනස්වන බව දැන සිටීම අවශ්ය වේ. ජනයා අතර වැදගත් පුත්ගලයෝ වෙති ඔවුන් අතර නිලයක් ඇති පුද්ගලයෝ වෙති. එවිට ඔහුට ගැලපෙන අයුරින් ආගන්තුක සත්කාර කළ යුතුය. එමෙන්ම ජනයා අතර මධ්යස්තව සිටින්නෝද වෙති. එවිට ඔහුට ගැලපෙන අයුරින් ආගන්තුක සත්කාර කළ යුතුය. එ් හැර වෙනත් ස්ථාවරයක සිටින්නෝද වෙති එවිට ඔවුනට ගැලපෙන අයුරින් ආගන්තුක සත්කාර කළ යුතුව ඇත.

http://www.sunnah.global/hadeeth/si/show/3042